# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2019

# 25B - යුරෝපා ඉතිහාසය

## ලකුණු බෙදී යාමේ ආකාරය

I පත්‍රය 01 x 40 = 40

II පත්‍රය

| | | |
|---|---|---|
| අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු | = | 18 |
| සෙසු ප්‍රශ්න 3කට 14 බැගින් | = | 42 |
| II පත්‍රය අවසාන ලකුණු | = | 60 |

අවසාන ලකුණු = 40 + 60 = 100

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | ............................................<br>............................................<br>............................................ | √ | △ 4/5 |
| (ii) | ............................................<br>............................................<br>............................................ | √ | △ 3/5 |
| (iii) | ............................................<br>............................................<br>............................................ | √ | △ 3/5 |

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

යුරෝපා ඉතිහාසය II (I කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி I)
History of Europe II (Part I)

25 B S II

2019.08.23 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා

විභාග අංකය: ..................................

**උපදෙස්:**

- මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- මෙම කොටසට **ලකුණු 40 ක්** දෙනු ලැබේ.
- කොටස් දෙකට ම මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) ඇසොව් (2) ඇල්ප්ස් (3) ඇපිනයින් (4) කොකේසස් (5) පිරනීස් (.........)

**2.** (1) සියුස් (2) ඇතීනා (3) ඇෆ්‍රොඩයිටී (4) පොසීඩන් (5) ජුපිටර් (.........)

**3.** (1) රාජාණ්ඩුව (2) කතිපයාධිපති ආණ්ඩුව (3) පූජක තන්ත්‍රය (4) ප්‍රජා පීඩන පාලනය (5) ප්‍රජාතන්ත්‍රවාදය (.........)

**4.** (1) සොලොන් (2) සිසරෝ (3) පිසිස්ට්‍රාටස් (4) ක්ලීස්තිනීස් (5) පෙරික්ලීස් (.........)

**5.** (1) තේලීස් (2) පයිතගරස් (3) ඩිමොක්‍රිටස් (4) ඩයනීසස් (5) ආකිමිඩීස් (.........)

**6.** (1) පාර්ලිමේන්තුව (2) ප්‍රිවි කවුන්සලය (3) ස්ටේට්ස් ජෙනරල් (4) රයිෂ්ටාග් (5) ඩූමා (.........)

**7.** (1) ට්‍රැෆල්ගාර් සටන (2) ඔස්ටර්ලිට්ස් සටන (3) මැජෙන්ටා සටන (4) ජේනා සටන (5) ලිප්සිග් සටන (.........)

**8.** (1) අයිලා ෂැපෙල් (2) ට්‍රොපෝ (3) ලයිබැක් (4) විලාෆ්‍රැන්කා (5) වෙරෝනා (.........)

**9.** (1) ලොයිඩ් ජෝර්ජ් (2) ක්ලෙමන්සෝ (3) වුඩ්රෝ විල්සන්
(4) ඕර්ලැන්ඩෝ (5) රූස්වෙල්ට් (.........)

**10.** (1) බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලය
(2) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
(3) උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (NATO)
(4) වෝර්සෝ ගිවිසුම
(5) යුරෝපා සංගමය (EU) (.........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද එකිනෙකට **නො ගැළපේ**. එම **නො ගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) හෝමර් - ඔඩිසි
(2) සොෆොක්ලීස් - ඉඩිපස් රෙක්ස්
(3) ඇරිස්ටොෆනීස් - වලාකුළු (The Clouds)
(4) සොක්‍රටීස් - දේශපාලනය (Politics)
(5) ප්ලේටෝ - සමූහාණ්ඩුව (The Republic) (.........)

**12.** (1) ටොලමි - භූකේන්ද්‍රීය න්‍යාය
(2) කොපර්නිකස් - සූර්ය කේන්ද්‍රීය න්‍යාය
(3) අයිසැක් නිව්ටන් - පරිණාමවාදී න්‍යාය
(4) මාරි කියුරි - රේඩියම් සොයා ගැනීම
(5) ඇල්බට් අයින්ස්ටයින් - සාපේක්ෂතාවාදී සිද්ධාන්තය (.........)

**13.** (1) වැලොයි - ප්‍රංශය
(2) බූගන්සා - ස්පාඤ්ඤය
(3) ඔරෙන්ජ් - නෙදර්ලන්තය
(4) රොමනොෆ් - රුසියාව
(5) සැවෝයි - ඉතාලිය (.........)

**14.** (1) සියක් අවුරුදු යුද්ධය - ප්‍රංශය පාර්ශ්වකරුවෙකි
(2) තිස් අවුරුදු යුද්ධය - ප්‍රංශය පාර්ශ්වකරුවෙකි
(3) හත් අවුරුදු යුද්ධය - ප්‍රංශය පාර්ශ්වකරුවෙකි
(4) ක්‍රිමියන් යුද්ධය - ප්‍රංශය පාර්ශ්වකරුවෙකි
(5) සත් සති යුද්ධය - ප්‍රංශය පාර්ශ්වකරුවෙකි (.........)

**15.** (1) ජෝන් ලොක් - පරමාධිකාරී රාජාණ්ඩුව
(2) ජෙරමි බෙන්තම් - උපයෝගිතාවාදය
(3) වී. අයි. ලෙනින් - නිර්ධන පාන්තික ආඥාදායකත්වය
(4) ලියොන් ට්‍රොට්ස්කි - නොනවතින විප්ලවය
(5) ජෝශප් ස්ටාලින් - තනි රටේ සමාජවාදය (.........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | හෙරක්ලීටස් | A | "සියලු දේ මනින මිනුම් දණ්ඩ මිනිසා ය." |
| (ii) | ප්‍රොටගරස් | B | "එක ගඟට දෙවරක් බැසිය නොහැකි ය." |
| (iii) | සොක්‍රටීස් | C | "සෑම රෝගයකට ම ස්වාභාවික හේතුවක් ඇත." |
| (iv) | හිපොක්‍රටීස් | D | "මිනිසා වූ කලී දේශපාලන සත්ත්වයෙකි." |
| (v) | ඇරිස්ටෝටල් | E | "සද්භාවය වූ කලී දැනුමයි." |

(1) ABECD (2) AEDCB (3) BAECD (4) BEACD (5) DEABC (.........)

[තුන්වැනි පිටුව බලන්න

**17.**

| X | Y |
|---|---|
| (i) පාර්තිනොන් | A මොස්කව් |
| (ii) කොලොසියම් | B ලන්ඩන් |
| (iii) ක්‍රෙම්ලින් | C රෝමය |
| (iv) වෙස්ට්මිනිස්ටර් මාලිගය | D පැරිස් |
| (v) නෝත්‍ර දාම් දෙව්මැදුර | E ඇතැන්ස් |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EACDB (5) ECABD(………)

**18.**

| X | Y |
|---|---|
| (i) මසච්චියෝ | A වීනස්ගේ උපත |
| (ii) බොටිචෙලි | B ඇඩම් සහ ඊව් උද්‍යානයෙන් නෙරපීම |
| (iii) ලෙනාඩෝ ඩා වින්චි | C පස්වන චාල්ස් අධිරාජයා |
| (iv) මයිකලාංජලෝ | D අවසාන රාත්‍රී භෝජන සංග්‍රහය |
| (v) ටිටියන් | E අවසාන විනිශ්චය |

(1) ABDEC (2) BADEC (3) BAEDC (4) BEACD (5) CDAEB(………)

**19.**

| X | Y |
|---|---|
| (i) රයින් සංයුක්ත රාජ්‍යය | A මෙටර්නික් |
| (ii) ජර්මන් සංයුක්ත රාජ්‍යය | B පළමුවන කයිසර් විලියම් |
| (iii) උතුරු ජර්මන් සංයුක්ත රාජ්‍යය | C ෆ්‍රෙඩ්රික් ඊබට් |
| (iv) ජර්මන් අධිරාජ්‍යය | D බිස්මාර්ක් |
| (v) වයිමාර් සමූහාණ්ඩුව | E නැපෝලියන් බොනපාට් |

(1) ACEDB (2) AEDBC (3) DECAB (4) EADBC (5) EDACB(………)

**20.**

| X | Y |
|---|---|
| (i) නැපෝලියන් බොනපාට් | A ලේ සහ යකඩ ප්‍රතිපත්තිය |
| (ii) ඔටෝ ෆොන් බිස්මාර්ක් | B මහාද්වීපික ක්‍රමය |
| (iii) වී. අයි. ලෙනින් | C සාමකාමී සහජීවනය |
| (iv) නිකිතා කෘෂෙෆ් | D පෙරෙස්ත්‍රොයිකා හෙවත් ආර්ථික ප්‍රතිව්‍යුහකරණය |
| (v) මිහායල් ගොර්බචෙෆ් | E නව ආර්ථික ප්‍රතිපත්තිය |

(1) BAECD (2) CABDE (3) CEABD (4) DECBA (5) EDABC(………)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ**. එය තෝරා ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. වැඩවසම් ක්‍රමය හා එහි ලක්ෂණ**

(1) මධ්‍යකාලීන යුරෝපයේ පැවැති දේශපාලන හා සමාජ-ආර්ථික ක්‍රමයයි.
(2) රදළයෝ තමන් භුක්ති විඳි ඉඩම් වෙනුවෙන් රජතුමාට යුද්ධ අවස්ථාවල දී හමුදා සැපයූහ.
(3) ශක්තිමත් මධ්‍යම පන්තිය
(4) බණ්ඩාරගම් (ප්‍රවේණි) ක්‍රමය
(5) ප්‍රවේණිදාසභාවය (………)

**22. එංගලන්තයේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වර්ධනය**

(1) 1215 දී ජෝන් රජතුමා විසින් මහාධිකාර පත්‍රයට අත්සන් තැබීම
(2) 1688 විප්ලවයෙන් රජතුමා අභිබවා පාර්ලිමේන්තුව ජයග්‍රහණය කිරීම
(3) දහඅටවන සියවසේ මුල් භාගය තුළ අගමැති ධූරය මුල්බැස ගැනීම
(4) 1832 ප්‍රතිසංස්කරණ පනතින් සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම
(5) 1911 දී සාමි මන්ත්‍රී මණ්ඩලයේ බලතල අඩු කිරීම (………)

**23.** **ජාතික රාජ්‍ය**

(1) රජු වෙත බලය කේන්ද්‍රණය කරන ලද පරමාධිකාරී රාජාණ්ඩුව
(2) ශක්තිමත් ස්ථාවර හමුදාව
(3) නිශ්චිත දේශසීමා
(4) ජාතික ඒකීයභාවය ඉහළ මට්ටමක පැවතීම
(5) යුරෝපයේ ප්‍රථම ජාතික රාජ්‍යය ජර්මනියේ ආරම්භ විය. (.........)

**24.** **රුසියන් විප්ලවය**

(1) දේශපාලන හා ආර්ථික පීඩනය මෙන්ම සමාජ අසහනයද විප්ලවය ඇති වීමට ප්‍රධාන හේතුවකි.
(2) බටහිර බලවත් රටවල් සාර්වරයාට එරෙහිව විප්ලවවාදීන්ට ආධාර කළහ.
(3) ලිබරල් (මෙන්ෂෙවික්) විප්ලවය 1917 මාර්තු මස සිදු විය.
(4) බොල්ෂෙවික්වරු රුසියාවේ බලය අල්ලා ගත්හ.
(5) වී. අයි. ලෙනින් විසින් විප්ලවය මෙහෙයවන ලදී. (.........)

**25.** **ෆැසිස්ට්වාදයේ ලක්ෂණ**

(1) අන්තවාදී ජාතිවාදය
(2) අධිපතිවාදී ආණ්ඩුක්‍රමය
(3) ප්‍රජාතන්ත්‍රවාදයට කිසිම තැනක් නැති තනි පක්ෂ රජය
(4) හමුදා ශක්තිය සහ ප්‍රචණ්ඩත්වය
(5) සාමකාමී විදේශ ප්‍රතිපත්තිය (.........)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,
**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ........ **5** ද, **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26.** **ප්‍රති රෙපරමාදුව සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) ප්‍රති රෙපරමාදුව රෝමානු කතෝලික පල්ලියට එරෙහි ව්‍යාපාරයක් ලෙස පැන නැංගේ ය.
(B) ප්‍රති රෙපරමාදුවේ එක් වැදගත් අංගයක් වූයේ ජේසු සංගමයයි.
(C) 1479 දී අධර්ම මර්දනාධිකරණය ස්පාඤ්ඤයේ පිහිටුවනු ලැබී ය
(D) ට්‍රෙන්ට් සම්මේලනය මගින් ප්‍රොතෙස්තාන්ත දහම නිර්වචනය කොට පැහැදිලි ලෙස ඉදිරිපත් කරන ලදී. (.........)

**27.** **කාර්මික විප්ලය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) කෘෂිකාර්මික ආර්ථිකයක සිට කර්මාන්තශාලාවල යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් කෙරෙන නිෂ්පාදනය මුල්කරගත් නාගරික ආර්ථිකයක් කරා ඇති වූ පරිවර්තනය කාර්මික විප්ලවය නමින් හැඳින් වේ.
(B) කාර්මික විප්ලවයෙන් ඵලදායිතාව හා ආර්ථික වර්ධනය වැඩි විය.
(C) කාර්මික විප්ලවය මුලින් ම ප්‍රංශයේ ආරම්භ විය.
(D) යුරෝපය තුළ මුළුමනින් ම කාර්මීකරණයට භාජනය වූ මුල් ම රට පෘතුගාලයයි. (.........)

**28.** **නැපෝලියන් බොනපාට් සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) නැපෝලියන් බොනපාට් ප්‍රංශ විප්ලවයෙන් බිහිවූ දරුවා ලෙස හැඳින් වේ.
(B) නැපෝලියන් බොනපාට් නයිල් සටනේ දී එංගලන්තය පරාජයට පත් කළේ ය.
(C) නැපෝලියන් බොනපාට් 1804 දී ප්‍රංශ අධිරාජයා ලෙස කිරුළ පැළඳී ය.
(D) නැපෝලියන් බොනපාට් කැල්වින් දහම නිල රාජ්‍ය ආගම ලෙස පිළිගත්තේ ය. (.........)

**29. ජර්මනිය එක්සත් කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) ජර්මනිය ඔස්ට්‍රියාවේ නායකත්වය යටතේ එක්සත් කරන ලදී.
(B) කාබොනාරි ව්‍යාපාරයේ සාමාජිකයෝ අවස්ථා කිපයකදී ම ජර්මනිය එක්සත් කිරීමට උත්සාහ කළහ.
(C) ෂ්ලෙස්විග් හා හෝල්ස්ටයින් මුල්කරගෙන 1864 ඇති වූ යුද්ධයේ දී ඔස්ට්‍රියාව සහ ප්‍රශියාව විසින් ඩෙන්මාර්කය පරාජයට පත් කරන ලදී.
(D) ප්‍රංශ-ප්‍රශියන් යුද්ධය ජර්මනිය එක්සත් කිරීම සම්පූර්ණ කළේ ය. (.........)

**30. නව අධිරාජ්‍යවාදය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) කාර්මික විප්ලවය, නව අධිරාජ්‍යවාදය ඇති වීමට මග පෑදී ය.
(B) අමුද්‍රව්‍ය හා වෙළෙඳපොළ සඳහා යුරෝපා බලවතුන් අතර ඇති වූ උග්‍ර තරඟය හේතුකොට ගෙන නව අධිරාජ්‍යවාදය බිහි විය.
(C) නව අධිරාජ්‍යවාදයේ ප්‍රතිඵලයක් ලෙස අප්‍රිකා මහද්වීපය යුරෝපා බලවතුන් අතර කැබලි වී ගියේ ය.
(D) පළමුවන ලෝක යුද්ධය ඇති වීමට තුඩු දුන් එක් සාධකයක් වූයේ නව අධිරාජ්‍යවාදයයි. (.........)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** පළමුවන රෝම අධිරාජයා ලෙස සැලකෙන්නේ කවු ද?

(1) මහා ඇලෙක්සැන්ඩර් (2) ජුලියස් සීසර් (3) ඔගස්ටස්
(4) ක්ලෝඩියස් (5) මාකස් අවුරේලියස් (.........)

**32.** 1649 දී ප්‍රසිද්ධියේ මරණයට පත් කරන ලද එංගලන්තයේ රජතුමා කවු ද?

(1) පළමුවන ජේම්ස් (2) පළමුවන චාල්ස් (3) දෙවන චාල්ස්
(4) දෙවන ජේම්ස් (5) තුන්වන විලියම් (.........)

**33.** බලතල වෙන් කිරීම පිළිබඳ න්‍යාය ඉදිරිපත් කළේ කවු ද?

(1) ජීන් බොඩැන් (2) තොමස් හොබ්ස් (3) වෝල්ටෙයාර්
(4) මොන්ටෙස්කියු (5) රූසෝ (.........)

**34.** 'යුද්ධය හා සාමය' (War and Peace) නම් කෘතියේ කතුවරයා කවු ද?

(1) ඉවාන් තුර්ගිනිව් (2) ෆියෝදෝර් ඩොස්ටොයොව්ස්කි (3) ලියෝ ටොල්ස්ටෝයි
(4) හෙන්රික් ඉබ්සන් (5) මැක්සිම් ගෝර්කි (.........)

**35.** ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ ප්‍රථම චාන්සලර්වරයා කවු ද?

(1) කොන්රඩ් ඇඩිනුවර් (2) විලී බ්‍රාන්ට් (3) කුර්ට් කිසිංගර්
(4) හෙල්මුට් ෂ්මිට් (5) එරික් හොනෙකර් (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන් තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | ග්‍රීක-පර්සියානු යුද්ධය මුල්කරගෙන සිය 'ඉතිහාසය' නම් කෘතිය රචනා කළ හෙරඩෝටස් 'ඉතිහාසයේ පියා' ලෙස හඳුන්වනු ලැබේ. | ග්‍රීකයන් අතර ඉතිහාසය නම් විෂය ක්ෂේත්‍රය නිර්මාණය කළ හෙරඩෝටස් ඇතැම් අවස්ථාවලදී සිය මූලාශ්‍රය විවේචනාත්මක ලෙස පරීක්ෂා කරමින් පර්සියානු යුද්ධවල දී සත්‍ය වශයෙන් ම සිදු වූයේ කුමක්දැ'යි සෙවීමට උත්සාහ කළේ ය. | (.........) |
| **37.** | පෙට්‍රාක් 'මානවවාදයේ පියා' ලෙස හඳුන්වනු ලැබේ. | වෙස්ට්ෆේලියා ගිවිසුමෙන් තිස් අවුරුදු යුද්ධය අවසන් විය. | (.........) |
| **38.** | 1498 දී කැලිකට්හි ගොඩ බට වස්කෝ ද ගාමා 'අපි කුළුබඩු හා ක්‍රිස්තියානීන් සොයාගෙන පෙරදිගට පැමිණියෙමු' යනුවෙන් ප්‍රකාශ කළේ ය. | වස්කෝ ද ගාමා ලොව වටා යාත්‍රා කළ පළමු නාවිකයා ලෙස හඳුන්වනු ලැබේ. | (.........) |
| **39.** | මෙටර්නික්ගේ නායකත්වය යටතේ ෆ්‍රැන්ක්ෆර්ට් පාර්ලිමේන්තුව පවත්වනු ලැබී ය. | ජර්මනිය දේශපාලන වශයෙන් එක්සත් කිරීමට අවශ්‍ය ආර්ථික පදනම සොල්වරීනය විසින් සපයනු ලැබී ය. | (.........) |
| **40.** | ප්‍රංශ ජනාධිපති ඩි ගොල් යුරෝපා සංගමයට ඇතුළු වීම සඳහා බ්‍රිතාන්‍යයට ආධාර කළේ ය. | මිහායල් ගොර්බචෙෆ් යටතේ රුසියාව යුරෝපා සංගමයේ සාමාජිකයකු බවට පත් විය. | (.........) |

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019

නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்

| විෂය අංකය பாட இலக்கம் | 25 B | විෂය பாடம் | යුරෝපා ඉතිහාසය |
|---|---|---|---|

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 4 | 21. | 3 | 31. | 3 |
| 02. | 5 | 12. | 3 | 22. | 4 | 32. | 1 |
| 03. | 3 | 13. | 2 | 23. | 5 | 33. | 4 |
| 04. | 2 | 14. | 5 | 24. | 2 | 34. | 3 |
| 05. | 4 | 15. | 1 | 25. | 5 | 35. | 1 |
| 06. | 2 | 16. | 3 | 26. | 3 | 36. | 5 |
| 07. | 3 | 17. | 5 | 27. | 1 | 37. | 2 |
| 08. | 4 | 18. | 2 | 28. | 2 | 38. | 1 |
| 09. | 5 | 19. | 4 | 29. | 4 | 39. | 4 |
| 10. | 2 | 20. | 1 | 30. | 5 | 40. | 3 |

○ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**NEW**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

| | | | |
|---|---|---|---|
| යුරෝපා ඉතිහාසය II<br>ஐரோப்பிய வரலாறு II<br>History of Europe II | 25B | S |

| | |
|---|---|
| ප්‍රශ්න අංකය<br>வினா இல.<br>Question No. | 1 |
| විභාග අංකය<br>சுட்டெண்<br>Index No. | ................................ |



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු - නව නිර්දේශය

## ඉතිහාසය II (II කොටස)

## යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි. ව. 1989 දක්වා

උපදෙස්:

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නයටත් **B** හා **C** කොටස්වලින් එක ප්‍රශ්නය බැගින් තෝරාගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) සිසිලි (ii) රෝමය (iii) අද්‍රියාතික් මුහුද (iv) ඩැනියුබ් ගඟ

(v) පැරිස් (vi) තේම්ස් ගඟ (vii) ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය (viii) ඔස්ට්‍රියාව

(ix) නෙදර්ලන්තය (x) ශාන්ත පීටර්ස්බර්ග් (xi) ක්‍රිමියාව (xii) කීල් ඇළ

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි)

## B කොටස

2. පහත දක්වෙන ක්ෂේත්‍ර ඇසුරෙන් පුරාණ රෝම සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

(i) සාහිත්‍යය (ii) ගෘහ නිර්මාණ ශිල්පය (iii) ආගමික වෙනස්වීම්

**සාහිත්‍යය**

- රෝමවරුන් අතර ඉතාම දියුණු සාහිත්‍යයක් පැවතුණි.
- වර්ජිල්ගේ නිර්මාණ: ඊනිඩ් මහාකාව්‍යය, ඉකොලොක්ස් හා ජෝර්ජික්ස් කාව්‍ය.
- හොරස් නම් ගී කාව්‍ය රචක: ගීත කාව්‍ය, උපහාසාත්මක කාව්‍ය ආදිය.
- ඕවිඩ් කවියා: මෙටමොෆොසිස් කාව්‍යය.
- ලිවී සහ ටැසිටස්: ඉතිහාස කෘති
- ජුවෙනල් කවියා
- ප්ලෝටස් කවියා

**ගෘහ නිර්මාණ ශිල්පය**

- රෝම ගෘහ නිර්මාණ ශිල්පය ඉතා දියුණු මට්ටමක පැවති අතර එය පසුකාලීන යුරෝපා ඉතිහාසය කෙරෙහිද ඉමහත් බලපෑමක් ඇති කළේය.
- ක්‍රීඩාගාර - කොලෝසියම.
- මාළිගා - ඩයක්ලීෂියන් මාළිගය.
- නාන තටාක - කැරකැල්ලා.
- මහා මන්දිර -ඔගස්ටස් සීසර්, ලිවියා ආදීන්ගේ මන්දිර.
- රෝම ගෘහයන් ඇට්‍රියුම් (මැද මිදුලකට සමාන), අල්තාරය (නිවසේ දෙවියන් වන්දනාව සඳහා වූ ස්ථානය), පෙරිස්ටයිල් (දිගු ආලින්දයක ස්වරූපයේ ඉදිකිරීම) හා ආලින්ද වැනි අංගෝපාංගවලින් මෙන්ම වීදුරු කවුළු, සඳළුතල, සොල්දර වැනි අංගවලින්ද සමන්විත විය.
- පොදු ගොඩනැගිලි: වැසිකිලි, කැසිකිලි, නාන කාමර.
- විශේෂ ලක්ෂණ: ශිඛර ගෝලාර්ධ හා ආරුක්කු.

**ආගමික වෙනස්වීම්**

- පුරාණ ග්‍රීසියේ මෙන් පුරාණ රෝමවරුන් අතරද මුල්කාලයේදී බහුදේවවාදයක් පැවතුණි.
- දේව මණ්ඩලය: ජුපිටර් (අහසට අධිපති), මිනර්වා (ප්‍රඥාවට, කලාවට, වෙළඳාමට අධිපති දෙවඟන), මාර්ස් (යුද්ධයට අධිපති), වීනස් (ආලයට අධිපති දෙවඟන), නෙප්චූන් (මුහුදට අධිපති).
- අධිරාජයන් දේවත්වයෙහිලා සැලකීම.
- ආගම රෝම සංස්කෘතිය හා බැඳී තිබිණි.
- රෝම අධිරාජ්‍යය තුළ ක්‍රිස්තියානි ධර්මය පැතිරීම සහ ක්‍රිස්තියානි ධර්මය රාජ්‍ය ආගම ලෙස පිළිගනු ලැබීම.
    - ✓ කොන්ස්ටන්ටයින් - ක්‍රිස්තු ධර්මය වැළඳගත් මුල්ම අධිරාජයා
    - ✓ තියඩෝසියස් - රෝමවරුන් ඇදහිය යුතු එකම ආගම ක්‍රිස්තියානි ආගම යයි ප්‍රකාශයට පත් කිරීම.
- පසුකාලීනව පාප් සංස්ථාව, කතෝලික සභාව හා පූජක තනතුරු ආදිය වර්ධනය විය.

**(ලකුණු 16 යි)**

**3. "ප්‍රොතෙස්තාන්ත රෙපරමාදුව බහුවිධ හේතු ගණනාවකින් හටගැණිනි. ඒ අතුරෙන් ඇතැම් ඒවා සමකාලීන ආගමික, දේශපාලන හා ආර්ථික තත්ත්වය සමග කිට්ටුවෙන් බැඳී පැවතුණි."**

**(i) ප්‍රොතෙස්තාන්ත රෙපරමාදුව ආරම්භ වූ රට නම් කරන්න.**

ජර්මනිය

**(ලකුණු 01 යි)**

**(ii) ප්‍රොතෙස්තාන්ත රෙපරමාදුව ඇති වූයේ කුමන ආගමික ආයතනයකට හා එහි නායකයාට එරෙහිව ද?**

කතෝලික සංවිධානය සහ පාප් වහන්සේ

**(ලකුණු 02 යි)**

**(iii) ප්‍රොතෙස්තාන්ත රෙපරමාදු ව්‍යාපාරයේ නායකයන් <u>දෙදෙනෙකු</u> නම් කරන්න.**

මාටින් ලූතර්, උල්රිච් ස්විංග්ලි, ජෝන් කැල්වින්

**(ලකුණු 02 යි)**

**(iv) ප්‍රොතෙස්තාන්ත රෙපරමාදුව ඇති වීමට තුඩු දුන් ආගමික, දේශපාලන හා ආර්ථික හේතුවල සාපේක්ෂ වැදගත්කම විවේචනාත්මකව විමසන්න.**

**ආගමික**

- කතෝලික සභාවේ දූෂණ හා එහි පිරිහීම: පාප්වරුන් කීප දෙනෙක් පත්වීම හා ඔවුන් අතර ගැටුම් ඇතිවීම; ඇතැම් පාප්වරුන් සුඛෝපභෝගී ජීවිත ගත කරමින් ලෞකිකත්වයට නැඹුරුවීම; කතෝලික සභාව ප්‍රතිසංවිධානය කළ යුතු බවට අදහස් හා උද්ඝෝෂණ ඇති වූ නමුත් ඒවාට එම සභාව සවන් නොදීම.

- පුනරුදයේ ප්‍රතිඵලයක් ලෙස පූජකයන් නොවන අන් අයටද බයිබලය කියැවීමේ අවස්ථාව හා හැකියාව ලැබීම හා පාප්වරුන් හා පූජකයන් ගත කරන ජීවිත ආගමික ඉගැන්වීම්වලට පටහැනි බව පෙනී යාම.

**දේශපාලන**

- යුරෝපයේ ජාතික රාජ්‍ය නැගී ඒම හා ඒවායේ පාලකයන්, සිය රටවල ක්‍රිස්තු සභාවට හා පූජකයන්ට තිබූ බලය නොඉවසීම; ජර්මනිය තුළ ශුද්ධ රෝම අධිරාජයා හා ප්‍රාදේශීය කුමාරවරුන් අතර පැවති දේශපාලන ගැටුම.

**ආර්ථික**

- යුරෝපයේ සෑම රටකම පිහිටි විශාල ඉඩම් ප්‍රමාණයක් පල්ලිය සතුව පැවතීම; එම ඉඩම්වලින් හා ඒවායින් ලද බදුවලින් පල්ලිය ආදායම් ලබාගත් අතර එයින් සැලකිය යුතු ප්‍රමාණයක් රෝමයට ඇදී යාම; මේ සම්බන්ධයෙන් රජවරුන්, නැගීගෙන ආ මධ්‍යම පාන්තිකයන් හා පොදු ජනතාව අතර හටගත් විරෝධය; කැල්වින් ආදීන් ඉදිරිපත් කළ අදහස් නැගීගෙන ආ වෙළඳ පන්තියට වඩාත් හිතකර වීම.
- ආසන්නතම හේතුව: ටෙට්සල්ගේ පුණ්‍ය එල (පූර්ණ එල) විකිණීමේ ව්‍යාපාරය.

**(ලකුණු 11 යි)**

**4. (i) ප්‍රංශ විප්ලවය ඇති වීමට තුඩු දුන් ප්‍රධාන සාධක විග්‍රහ කරන්න.**

- **දේශපාලන:** බලය කේන්ද්‍රගත කරන ලද ඒකාධිපති රාජාණ්ඩුව; රිචලියු හා මැසරීන් රදළයන් සතු ප්‍රාදේශීය බලය ඔවුන් වෙතින් ඉවත් කොට කිරීටය වෙත පැවරීමටත්, මධ්‍යම ආණ්ඩුව වෙත පරිපාලනය කේන්ද්‍රගත කිරීමටත් පියවර ගැනීම; විප්ලවාසන්න සමයේ පැවති අකාර්යක්ෂම පරිපාලනය.

- **ආර්ථික:** කෘෂිකර්මාන්තය පදනම් කරගත් වැඩවසම් සම්බන්ධතා මත සංවිධානය වූ ආර්ථිකය; වෙළඳාම පුළුල් වී තිබීම; ඉඩම් කොටු කිරීම ආරම්භකොට තිබීම; විප්ලවාසන්න සමයේ ඇතිවී තිබූ මූල්‍ය අර්බුදය.

- **සමාජ:** ප්‍රංශ සමාජය ප්‍රජා ගණ තුනකින් සමන්විත වීම - පූජකයන්, රදළයන් හා සාමාන්‍ය ජනතාව (මධ්‍යම පන්තිය, ගොවි ජනතාව හා නාගරික කම්කරුවන්); මෙම සමාජ කොටස් මුහුණ දුන් විවිධ ප්‍රශ්න හා ඔවුන්ගේ දුක්ගැනවිලි; විශේෂයෙන් සාමාන්‍ය ජනතාවගේ දුක් ගැනවිලි ප්‍රංශ විප්ලවය ඇතිවීම කෙරෙහි බලපෑම. පූර්ව විප්ලවීය ප්‍රංශයේ ජීවත් වූ දාර්ශනිකයන් (වොල්ටෙයාර්, මොන්ටෙස්කියු හා රූසෝ) හා ඔවුන්ගේ අදහස් විප්ලවය ඇතිවීමට බලපෑ අන්දම.

- අමෙරිකානු නිදහස් සටනේ බලපෑම.

- මූල්‍ය අර්බුදය.

**(ii) ප්‍රංශ විප්ලවය, ප්‍රංශය සහ යුරෝපයේ සෙසු රටවල් කෙරෙහි ඇති කළ බලපෑම පරීක්ෂා කරන්න.**

- ප්‍රංශයේ එතෙක් ශේෂව පැවති වැඩවසම් ලක්ෂණ අහෝසි වීම.
- රදළ හා පූජක ආධිපත්‍යය බිඳවැටීම.
- මධ්‍යම පාන්තිකයන් සිය දේශපාලන අරමුණු සාක්ෂාත් කරගැනීම.
- ඒකීය බදු, ඒකීය පරිපාලනය ආදී වූ ප්‍රතිසංස්කරණ හේතුකොටගෙන ගොවීන් සිය අයිතිවාසිකම් දිනාගැනීම.
- රාජාණ්ඩුව පෙරළා සමූහාණ්ඩුවක් පිහිටුවීම.
- ප්‍රංශය තුළ ඒකීය පාලන රටාවක් ඇතිවීම.
- මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශනයක් එළිදැක්වීම.
- නිදහස, සමානාත්මතාව හා සහෝදරත්වය වැනි සංකල්ප ප්‍රචලිත වීම.
- සෙසු යුරෝපා රටවලත් ඒකාධිපති රාජාණ්ඩු පාලන ක්‍රම අභියෝගයට ලක්කිරීම.
- යුරෝපා රටවල ජාතිකවාදී සහ ලිබරල්වාදී අදහස් පැතිරයාම සහ ඒ හේතුකොටගෙන දේශපාලන අරගල හටගැනීම.

**(ලකුණු 16 යි)**

**5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.**

**(i) ග්‍රීක පෞර රාජ්‍ය**

**(ii) ස්පාඤ්ඤය නිරතවූ දේශ ගවේෂණ**

**(iii) රිචලියුගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්තිය**

**(iv) අමෙරිකන් නිදහස් සටන ඇති වීමට තුඩු දුන් පසුබිම**

**(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගිනි)**

**(i) ග්‍රීක පෞර රාජ්‍ය**

- පුරාණ ග්‍රීකයන්ගේ දේශපාලන සමාජය, පෞර රාජ්‍ය මත පදනම්ව පැවතීම; එම රාජ්‍ය විශාල සංඛ්‍යාවක් පැවතීම: ඇතන්ස්, ස්පාටා, තීබ්ස්, මෙගාරා, කොරින්ත්, ආර්ගෝස්, මිලෙටස්, සමෝස් ඒ අතරින් වඩාත් ප්‍රකට කීපයක් වීම.

- ස්වාධීන රාජ්‍ය ලෙස පැවතීම.

- භූමි ප්‍රමාණයෙන් හා ජනගහණයෙන් කුඩාවීම.

- සමාජ ව්‍යුහය: පුරවැසියන්, විදේශිකයන් හා වහලුන්.

- මෙම පෞර රාජ්‍ය බොහොමයක් තුළ බොහෝදුරට එක හා සමාන ආණ්ඩුක්‍රම විකාශයක් සිදු වූ අතර ඒවායේ විවිධ ආණ්ඩුක්‍රම පැවතීම.
    - රාජාණ්ඩුව
    - ප්‍රභූතන්ත්‍රය
    - කතිපයාධිපති ආණ්ඩුව
    - ප්‍රජාපීඩක පාලනය
    - ප්‍රජාතන්ත්‍රවාදය: ඇතන්ස්හි පැවති ප්‍රජාතන්ත්‍රවාදය පුරවැසියන් පමණක් පාලනයට සහභාගී වූ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වීම.
- ආගම
    - ස්වභාවික වස්තූන්ට දේවත්වය ආරූඪකොට වැඳුම්පිදුම් කිරීම. එහෙත් ග්‍රීකයන් තුළ දෙවියන් කෙරෙහි පැවති බිය බොහෝදුරට අඩුව තිබීම. දෙවියන්ට මනුෂ්‍ය ස්වරූපය හා ගති පැවතුම් ආරූඪ කර තිබීම.
    - දේව පරපුරක් පිළිබඳ විශ්වාස කිරීම (බහුදේවවාදය). සියුස් (ආකාශ දෙවියා) ප්‍රධාන කොටගත් දේව මණ්ඩලය.
    - ග්‍රීක ආගම නිදහස් චින්තනයට බාධාකාරී නොවීම එසේම විවිධ කලාවන්ගේ දියුණුවට ආගමෙන් අනුබල ලැබීම.
    - ග්‍රීකයන් අතර එක්තරා දුරකට ආගමික එක්සත්භාවයක් පැවතීම.

**(ලකුණු 08 යි)**

**(ii) ස්පාඤ්ඤය නිරතවූ දේශ ගවේෂණ**

- ක්‍රිස්ටොෆර් කොළම්බස්-කැරිබියන් දූපත්වලට ගොඩබැසීම
- අමෙරිගෝ වෙස්පූචි-අමෙරිකා මහද්වීපයට ගොඩ බැසීම
- ෆර්ඩිනන්ඩ් මැගලන්-ලොව වටා යාත්‍රා කිරීම
- හර්නැන්ඩෝ කෝර්ටීස්-මෙක්සිකෝව ජයගැනීම
- ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ-පේරු දේශය ජයගැනීම
- මැගලන්ගේ නාවික ගමනින් පසු ස්පාඤ්ඤයන් පිලිපීන දූපත්වල සිය ආධිපත්‍යය පිහිටුවීමට පෙළඹීම.

**(ලකුණු 08 යි)**

### (iii) රිචලියුගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්තිය

- ♦ රිචලියුගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණු දෙකක් ගැබ්ව පැවතුණි.
  - ප්‍රංශ රජුගේ / රාජාණ්ඩුවේ ආධිපත්‍යයට පැවති සියලු සීමා නැති කිරීම.
  - ප්‍රංශය යුරෝපයේ බලවත්ම රාජ්‍යය බවට පත් කිරීම.
- ♦ ප්‍රංශ රදළයන් හා හියුගනෝවරුන් මර්දනය කිරීම.
- ♦ ප්‍රංශ මධ්‍යම ආණ්ඩුවේ බලය වර්ධනය කිරීම. මුළු රටම දිස්ත්‍රික්ක 32 කට බෙදා ඒවායේ ප්‍රධානීන් ලෙස ඉන්ටෙන්ඩාන්ට් නම් නිලධාරීන් පත් කිරීම; ඔවුන් කෙලින්ම මධ්‍යම ආණ්ඩුවට වගකිව යුතු වීම.
- ♦ විදේශ ප්‍රතිපත්තිය - හැප්ස්බර්ග් බලය බිඳදැමීමට ක්‍රියාකිරීම.
  - කතෝලිකයන් හා ප්‍රොතෙස්තාන්තවාදීන් අතර ඇති වූ තිස් අවුරුදු යුද්ධයේදී (කතෝලික ප්‍රංශය) ප්‍රොතෙස්තාන්තවාදීන්ට ආධාර දෙමින් ශුද්ධ රෝම අධිරාජ්‍යයේ බලය බිඳදැමීමට කටයුතු කිරීම.

**(ලකුණු 08 යි)**

### (iv) අමෙරිකන් නිදහස් සටන ඇති වීමට තුඩු දුන් පසුබිම

- ♦ එංගලන්තය උතුරු අමෙරිකාවේ ඉංග්‍රීසි ජනපද සම්බන්ධයෙන් අනුගමනය කළ යටත්විජිත ප්‍රතිපත්තිය.
  - ජනපදවල ව්‍යවස්ථාදායක සභාවලට ව්‍යවස්ථා සම්පාදනය කළ හැකි වූයේ යම් යම් සීමාවලට යටත්වයි. අය බදු පැනවීමේ බලය තිබූ නමුත් තීරු බදු පැනවීමේ බලය එංගලන්ත පාර්ලිමේන්තුව සතු වීම.
  - ජනපදවල සම්මත කරන ව්‍යවස්ථා, අණපනත් එංගලන්තයේ නීතිරීතිවලට පටහැනි නොවිය යුතු වූ අතර, ඒවා ක්‍රියාත්මක කිරීමට එංගලන්තයේ අනුමැතිය අවශ්‍ය වීම.
  - විධායක බලය මුළුමනින්ම එංගලන්තය සතු වූ අතර අධිකරණය එංගලන්තයේ පැවති ක්‍රමයට සකස්ව තිබීම.
  - ආර්ථික ප්‍රතිපත්තිය, වාණිජවාදී න්‍යායන්ට අනුව සකස්ව තිබූ බැවින්, යටත්විජිත, මව් රටේ යහපත සඳහා පවතිනවාය යන අදහස පදනම් කරගෙන එය ක්‍රියාත්මක වීම.
    - ✓ නම් කළ භාණ්ඩ ලෙස හඳුන්වන ලද භාණ්ඩ වර්ග එංගලන්ත වෙළඳපොළට පමණක් යැවිය යුතු වීම (දුම්කොළ, කපු, සීනි).
    - ✓ එංගලන්තයෙන් ජනපදවලට නිර්යාත කළ හැකි ද්‍රව්‍ය ජනපදවල නිපදවීම තහනම් කිරීම (ලොම් හිස් වැසුම්).
    - ✓ ජනපදවලට අත්‍යවශ්‍ය ඇතැම් ද්‍රව්‍ය ගෙන්වාගත හැකි වූයේ එංගලන්තය හරහා පමණක් වීම (තේ).
    - ✓ ජනපදවලට භාණ්ඩ ගෙන ඒම හා ජනපදවලින් භාණ්ඩ ගෙන යාම ඉංග්‍රීසි නැව්වලින් පමණක් කළ යුතු වීම.

- ✓ එංගලන්තය අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ - අමෙරිකාවේ ඉංග්‍රීසි ජනපද, සිය නිෂ්පාදන සඳහා වෙළඳපොළක් ලෙස හා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයන ස්ථානයක් ලෙස තබාගැනීම.

♦ මෙම යටත්විජිත ප්‍රතිපත්තියට එරෙහිව ජනපදවාසීන් අතුරින් ක්‍රමයෙන් විරෝධයක් මතුවීම හා ජනපදවාසීන් තුළ තිබූ විරෝධය උත්සන්න වී මව් රටට විරුද්ධව කෙරෙන යුද්ධයක් දක්වා එය වර්ධනය වීම.

♦ විරෝධය උත්සන්න වීමට බලපෑ සාධක:
- ▪ ජනපදවාසීන්ට මව් රටේ ආරක්ෂාව ලබාගැනීමට තිබූ අවශ්‍යතාව ක්‍රමයෙන් අඩුවීම.
  - ✓ 1756-63 අතර පැවති සත් අවුරුදු යුද්ධයෙන් එංගලන්තය ජයගැනීම නිසා ජනපදවාසීන්ට එල්ල වී තිබූ ප්‍රංශ තර්ජනය ඉවත් වීම.
  - ✓ රතු ඉන්දියානුවන්ගෙන් එතෙක් පැවති තර්ජනය ඉවත් වීම.
- ▪ එංගලන්තය තම යුධ වියදම් හා හමුදා නඩත්තුව සඳහා වැය කළ මුදල්, ජනපදවාසීන්ගෙන් ලබාගන්නට පියවර ගැනීම. නව බදු පැනවීම හා සියලු බදු පිළිබඳ නීති අකුරටම ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම (ටවුන්සෙන්ඩ් පනත්, වීදුරු බද්ද, මුද්දර බද්ද, තේ බද්ද).
- ▪ ජනපදවාසීන්ගේ විරෝධය හමුවේ තේ බද්ද හැර අනෙකුත් සියලු බදු ඉවත් කර ගැනීම හා එමගින් ජනපදවාසීන් තුළ හටගත් ධෛර්යය.

♦ කෙසේවෙතත්, බදු පැනවීමට තමන්ට ඇති අයිතිය පෙන්වීම සඳහා ඉංග්‍රීසි ආණ්ඩුව විසින් තේ බද්ද ක්‍රියාත්මක කිරීම හා ඊට එරෙහිව ඇතිවූ බොස්ටන් තේ සාදය.

♦ 1775 දී දෙපක්ෂය අතර ගැටුම් ඇතිවීම; 1776 ජූලි 4 දා ජනපදවාසීන් අමෙරිකානු ස්වාධිනතා ප්‍රකාශනය නිකුත් කිරීම. 1783 දී ජනපදවාසීන් එංගලන්ත හමුදා පරාජය කොට, අමෙරිකා නිදහස් සටන ජයගැනීම.

**(ලකුණු 08 යි)**

## C කොටස

**6. (i) වියනා සම්මේලනය විසින් ගනු ලැබූ ප්‍රධාන තීරණ විස්තර කරන්න.**

- ප්‍රංශයේ දේශසීමා, 1789 ට පෙර පැවති තත්ත්වයට ගෙන ඒම. බූර්බෝන් රාජවංශය යළි බලයේ පිහිටුවීම.
- පෙර පැවති 360 කට අධික රාජ්‍ය කොටස් සංඛ්‍යාව වෙනුවට ජර්මනිය තුළ රාජ්‍ය කොටස් 39 ක් ඇති කිරීම. ජර්මන් සංයුක්තය පිහිටුවීම හා එහි නායකත්වය ඔස්ට්‍රියාවට ලබාදීම.
- ජර්මානු ප්‍රදේශ තුළ ඔස්ට්‍රියාව හා ප්‍රශියාව අතර බලසමතුලිතතාවක් ඇති කිරීම. ඔස්ට්‍රියාවට ලොම්බාර්ඩි හා වෙනීෂියා ලබාදීම හා ප්‍රශියාවට අමතර ප්‍රදේශ ලබාදීම.
- ඉතාලිය - නිත්‍යානුකූලවාදය තදින්ම ක්‍රියාත්මක වූයේ ඉතාලියේය: ලොම්බාර්ඩිය, වෙනීෂියාව, පීඩ්මොන්ට්-සාර්ඩිනියා, පර්මා, මොඩීනා, ටස්කනි, පාප් රාජ්‍යය, නේපල්ස් හා සිසිලි යනුවෙන් ඉතාලිය කොටස් කර ඒවායේ පැරණි රාජවංශ යළි පිහිටුවීම.

**(ii) වියනා සම්මුතිය නූතන යුරෝපා ඉතිහාසයේ කඩඉමක් ලෙස කෙතෙක් දුරට සැලකිය හැකි දැයි පරීක්ෂා කරන්න.**

- නැපෝලියන් විසින් වෙනස්කොට තිබූ යුරෝපා දේශපාලන සිතියම නැවත සකස් කිරීම.
- 1815 සිට ඉදිරියට දිගුකලක් යුරෝපය තුළ සාමය ආරක්ෂා කරගැනීමට සමත්වීම (1854/56 ක්‍රිමියානු යුද්ධය තෙක් කිසිදු කැපී පෙනෙන යුද්ධයක් ඇති නොවීම; ඉන්පසුවද පළමුවන ලෝක යුද්ධය ඇතිවන තුරු බලවත් ජාතීන් සම්බන්ධ වූ යුද්ධයක් ඇති නොවීම).
- සමුළුවක් මගින් යුරෝපා රටවල් අතර හටගන්නා අර්බුද විසඳාගැනීමේ ක්‍රමයකට මුලපිරීම.
- සමුළු ක්‍රමය.

**(ලකුණු 16 යි)**

**7. "බාධක බොහොමයකට මුහුණ දුන් ඉතාලි එක්සත් ව්‍යාපාරය ජයග්‍රහණයෙන් අවසන් විය."**

**(i) "තරුණ ඉතාලිය" නම් සංවිධානය පිහිටුවන ලද ඉතාලි නායකයා නම් කරන්න.**

ජෝශප් මැසිනි

**(ලකුණු 01 යි)**

**(ii) ඔහු ඉතාලියේ පිහිටුවීමට අපේක්ෂා කළේ කවර ආකාරයේ ආණ්ඩුක්‍රමයක් ද?**

සමූහාණ්ඩුවක්

**(ලකුණු 01 යි)**

**(iii) ඉතාලිය එක්සත් කිරීමේ නායකත්වය ගත් රාජ්‍යය නම් කරන්න.**

පීඩ්මොන්ට්-සාර්ඩිනියා

**(ලකුණු 01 යි)**

**(iv) 1815 සිට 1848 දක්වා ඉතාලිය එක්සත් කිරීමට පැවති බාධක සැකෙවින් දක්වන්න.**

- ♦ රාජ්‍ය ගණනාවකට බෙදී පැවතීම ('ඉතාලිය යනු භූගෝලීය ප්‍රකාශයක් පමණකි' - මෙටර්නික්-) හා ඒවා බොහොමයක් විදේශාධිපත්‍ය යටතේ පැවතීම.
- ♦ ඔස්ට්‍රියානු බලය සහ ආධිපත්‍යය.
- ♦ වියනා සමථයේ තීරණ.
- ♦ පාප් වහන්සේගෙන් එල්ල වූ විරෝධය.
- ♦ ඉතාලි ජාතිකත්වය ඉතාලි ජාතිකයන් අතර ප්‍රමාණවත් ලෙස පැතිරගොස් නොතිබීම.
- ♦ එක්සත් කිරීම සම්බන්ධයෙන් තනි වැඩපිළිවෙලක්/ව්‍යාපාරයක් වෙනුවට විවිධ වැඩපිළිවෙලවල්/ක්‍රියාමාර්ග ඉදිරිපත් වීම.

**(ලකුණු 04 යි)**

**(v) ඉහත (iv) හි දක්වන ලද බාධක ජයගනිමින් ඉතාලිය එක්සත් කළ අයුරු පරීක්ෂා කරන්න.**

ඉතාලි ජාතිකත්වය වර්ධනය වීම හා එක්සත්භාවය පිළිබඳ අපේක්ෂා වර්ධනය වීම:

- ♦ 1848 වර්ෂයේදී ඉතාලි ප්‍රදේශවලද විප්ලව හටගැනීම.
- ♦ මෙම විප්ලව මුල් අවස්ථාවේදී සාර්ථක වීම.
    - පර්මා, ටස්කනි, පීඩ්මොන්ට්-සාර්ඩිනියා යන රාජ්‍යවල පාලකයන් ලිබරල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලබාදීමට ප්‍රතිඥා දීම. වෙනීසිය හා මිලාන් යන ප්‍රදේශවලින් ඔස්ට්‍රියානුවන් පළවා හැරීම.
    - පාප් වහන්සේ රෝමයෙන් පළායාම හා නව රෝම සමූහාණ්ඩුවේ ජනපති ලෙස මැසිනි පත්කර ගැනීම.
    - අවසානයේ විප්ලව අසාර්ථක වීම හා පෙර සිටි පාලකයන් නැවත බලයට පැමිණ කලින් පැවති පාලන තන්ත්‍ර යළි පිහිටුවීම.

ක්‍රමයෙන් තනි වැඩපිළිවෙලක් සඳහා සුදුසු නායකත්වය නිර්මාණය වීම (කැවූර්ගේ ක්‍රියාකලාපය):

- ♦ පීඩ්මොන්ට්-සාර්ඩිනියා රාජ්‍යයේ අගමැතිවරයා ලෙස කැවූර් පත්වීම හා නවීකරණ ක්‍රියාමාර්ගයක් අනුගමනය කරමින් ඔහු එම රාජ්‍යය සංවර්ධනය කිරීම. එමගින් ඔහු එම රාජ්‍යයේ නායකත්වය යටතේ ඉතාලිය එක්සත් කිරීම සඳහා පදනම දැමීය.
- ♦ පීඩ්මොන්ට්-සාර්ඩිනියා රාජ්‍යය ක්‍රිමියන් යුද්ධයට සහභාගී වීම හා ඉන් අනතුරුව ප්‍රංශයේ III නැපෝලියන්, ඔස්ට්‍රියාවට විරුද්ධ සටනකදී සාර්ඩීනියාවට ආධාර කිරීමට එකඟ වීම (ප්ලොම්බියර්ස් ගිවිසුම).

ඔස්ට්‍රියානු ආධිපත්‍යය බිඳදැමීම හා එක්සත් ව්‍යාපාරය ක්‍රමයෙන් සාර්ථක වීම:

- ♦ 1859 ඔස්ට්‍රො-සාර්ඩිනියා යුද්ධය. ලොම්බාර්ඩි ප්‍රදේශය සාර්ඩීනියාවට ඈඳාගැනීම. පර්මා, මොඩිනා, ටස්කනි හා රොමැඤ්ඤා යන මධ්‍යම ඉතාලි රාජ්‍ය සාර්ඩිනියාව වෙත ලබාදීම.
- ♦ 1860 ගැරිබෝල්ඩි සිසිලි රාජධානිය ආක්‍රමණය කිරීම.
- ♦ 1861 ගැරිබොල්ඩි විසින් තමන් යටත් කරගත් දකුණු ඉතාලි ප්‍රදේශ, වික්ටර් එමැනුවෙල් රජුට භාරදීම.

- 1861 වික්ටර් එමැනුවෙල් රජු ඉතාලියේ රජු ලෙස ප්‍රකාශයට පත් කිරීම.

- 1866 ඔස්ට්‍රෝ-ප්‍රශියන් යුද්ධය අවසානයේ ප්‍රශියාවේ සහයෝගයෙන් වෙනීෂියාව ඉතාලියට ඈඳාගැනීම.

<u>පාප්වරයාගෙන් එල්ලවූ බාධාව ඉවත්වීම:</u>

- 1870 ප්‍රංශ-ප්‍රශියානු යුද්ධ අවස්ථාවේදී ඉතාලි රාජ්‍යයට රෝමය ඈඳාගෙන ඉතාලිය එක්සත් රාජ්‍යයක් බවට පත් කිරීම.

**(ලකුණු 09 යි)**

**8. "දෙවන ලෝක යුද්ධය ඇතිවීමේ බීජ වර්සායි ගිවිසුමෙහි ගැබ්ව පැවතුණි." සාකච්ඡා කරන්න.**

- පළමුවන ලෝක යුද්ධය අවසානයේ ජර්මනිය සමග අත්සන් කරන ලද වර්සායි ගිවිසුම ඒකපාර්ශවීය, ජර්මනියට අතිශයින්ම අසාධාරණ හා නින්දාසහගත වූ ගිවිසුමක් ලෙස ජර්මනිය සැලකීම.

- යුද්ධයේ පූර්ණ වගකීම ජර්මනිය වෙත පැවරූ මෙම ගිවිසුමෙන් ජර්මනියට අයත්ව තිබූ භූමියෙන් සැලකිය යුතු ප්‍රදේශයක් ජර්මනියට අහිමි කිරීම (ඇල්සාස්-ලොරේන් ප්‍රංශයට භාරදීම).

- ජර්මනියේ හමුදා ශක්තිය විශාල වශයෙන් අඩු කිරීම: ලක්ෂයකට නොවැඩි භට සංඛ්‍යාවක පාබල හමුදාවකුත් සබ්මැරීන් රහිත යුද්ධ නැව් හයකට නොවැඩි නාවික හමුදාවකුත් ප්‍රහාරක ගුවන් යානා රහිත ගුවන් හමුදාවකුත් පවත්වාගෙන යාමට නියම කිරීම.

- යුධ වන්දියක් ගෙවීමට නියම කිරීම (පවුම් මිලියන 6600ක්).

- ජර්මනියේ ඇතැම් යටත්විජිත ජාතීන්ගේ සංගමයේ භාරකාරත්වය යටතට පත් කිරීම (අප්‍රිකාවේ).

- මෙම කොන්දේසි, හමුදාමය වශයෙන් මෙන්ම ආර්ථික වශයෙන්ද ජර්මනිය දුර්වල කිරීමට හේතුවීම.

- මේ නිසා ජර්මනිය තුළ වර්සායි ගිවිසුම කෙරෙහි දැඩි විරෝධයක් මතුව ඒම.

- මෙම තත්ත්වය ජර්මනිය තුළ නට්සිවාදය නැගී ඒමට හේතුවීම (හිට්ලර් ගිවිසුම ප්‍රසිද්ධියේ ඉරාදැමීම).

  මේ සියලුම තත්වයන් නිසා දෙවන ලෝක යුද්ධය ඇතිවීමේ මූලබීජ වර්සායි ගිවිසුම තුළ ගැබ්ව තිබූ බව ප්‍රකාශ කළ හැකිය. එසේ වුවත්, දෙවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් අනෙකුත් සාධක පිළිබඳවද සැකෙවින් හෝ දක්වා ඇත්නම් වැඩි ලකුණු ලබා දිය යුතුයි.

**(ලකුණු 16 යි)**

**9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.**

**(i) 1848 විප්ලවය**

**(ii) රුසියාවේ බොල්ෂෙවික් විප්ලවයේ ජයග්‍රහණය**

**(iii) නිරවි යුද්ධය**

**(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය**

**(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගිනි)**

**(iii) 1848 විප්ලවය**

- 1848 යුරෝපයේ විප්ලව වර්ෂය වශයෙන් හැඳින්වීම.
- වියානා සම්මේලනයේදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක වීමේදී ඊට එරෙහිව යුරෝපය තුළ ජාතිකත්ව හැඟීම් වර්ධනය වීම.
- ප්‍රංශය, ඔස්ට්‍රියාව වැනි රටවල ලිබරල් හා ජාතිකවාදී ව්‍යාපාරවලට එරෙහිව එම රටවල පාලකයන් මර්දනය ක්‍රියාත්මක කිරීම.
- යුරෝපයේ පැතිරයමින් තිබූ ලිබරල් දේශපාලන චින්තනයේ බලපෑම.
- රාජ්‍ය නිර්බාධවාදී ආර්ථික කටයුතු හා ලිබරල් දේශපාලනය අරමුණු කොටගත් මධ්‍යම පන්තියේ මැදිහත්වීම.
- ප්‍රංශය, ජර්මනිය, ඔස්ට්‍රියාව, හංගේරියාව හා ඉතාලිය යන රටවල ඇතැම් ප්‍රධාන නගරවල විප්ලව හටගැනීම.
- නගර කේන්ද්‍ර කරගෙන විප්ලව හටගත් අතර ඒවා ගම්බද ප්‍රදේශවලට ව්‍යාප්ත නොවීම.
- පැරිස්, බර්ලින් වැනි නගර මුල් කරගෙන හටගත් විප්ලව ජර්මානු ප්‍රදේශ, ඉතාලි ප්‍රදේශ, හංගේරියාව ආදී ප්‍රදේශ කරා ව්‍යාප්ත වීම.
- උගතුන් හා බුද්ධිමතුන්ගේ දායකත්වය ලැබීම.
- ඔස්ට්‍රියානු හමුදා බලය මෙන්ම කැරලිවල සැලසුම්සහගත බවක් නොමැතිවීම කැරලි අසාර්ථක වීමට හේතු වීම.
- අවසානයේ විප්ලව සියල්ලම පාහේ අසාර්ථක වීම - එහෙත් දිගුකාලීන වශයෙන් වැදගත් ප්‍රතිඵල උද්ගත වීම.
- 1789 න් ආරම්භ වූ යුරෝපයේ විප්ලව සමය 1848 න් අවසන්වීම.

**(ලකුණු 08 යි)**

### (iv) රුසියාවේ බොල්ෂෙවික් විප්ලවයේ ජයග්‍රහණය

- බොල්ෂෙවික් විප්ලවය ඇතිවූ පසුබිම (සැකෙවින්).
- බොල්ෂෙවික්වරුන්ගේ ජයග්‍රහණයට තුඩු දුන් හේතු:
    - සෝවියට් සභා හා තාවකාලික ආණ්ඩුව අතර ඇතිවූ ප්‍රතිවිරෝධතාව.
    - කම්කරුවන්ගෙන් හා ගොවීන්ගෙන් සැදුම්ලත් පීඩිත පන්තිය විප්ලවවාදීන්ට සහාය දීම.
    - රුසියාව පුරා පැතිරුණු වැඩවර්ජන ව්‍යාපාරය.
    - ලෙනින්ගේ හා ට්‍රොට්ස්කිගේ දක්ෂ නායකත්වය.
    - බොල්ෂෙවික්වරුන්ගේ සංවිධාන ශක්තිය.
    - ලොව ප්‍රථම සමාජවාදී රාජ්‍යය බිහිවීම.

**(ලකුණු 08 යි)**

### (v) නිරවි යුද්ධය

- නිරවි යුද්ධය යනු විශේෂයෙන් දෙවන ලෝක යුද්ධයෙන් පසු අමරිකා එක්සත් ජනපදය ප්‍රධාන කොටගත් බටහිර (ධනවාදී) කඳවුර හා සෝවියට් දේශය ප්‍රධාන කොටගත් නැගෙනහිර යුරෝපා රටවල්වලින් යුත් (සමාජවාදී) කඳවුර අතර ඇති වූ දෘෂ්ටිවාදීමය, දේශපාලන හා රාජ්‍ය තාන්ත්‍රික ගැටුමයි.

- මෙහි ආරම්භය හා පැවති කාලය සම්බන්ධයෙන් විවිධ මත පැවතුන ද බොහෝ විද්වත්හු මෙය 1945 සිට 1991 දක්වා පැවතුනැයි සලකති.
- නිරවි යුද්ධයේ ප්‍රධාන ලක්ෂණ:
    - අමෙරිකා එක්සත් ජනපදය හා සෝවියට් රුසියාව එකිනෙකාට විරුද්ධව විවෘත ලෙස යුද්ධ නොකිරීම.
    - කඳවුරු දෙක අතර පැවති අවිශ්වාසය, ගැටුම වර්ධනය වීමට හේතු වීම.
    - සෝවියට් රුසියාව, කොමියුනිස්ට්වාදය ලොව පුරා ව්‍යාප්ත කිරීමට උත්සාහගන්නා බවට චෝදනා කළ අමෙරිකාව එය වැළැක්වීමට උත්සාහ කිරීම.

- වරින් වර කඳවුරු දෙකට අයත් රටවල් අතර ඇති වූ සටන් හැරුණු විට නිරවි යුද්ධය ක්‍රියාත්මක වූ අනෙකුත් ක්‍රම:

    දේශපාලන හා ආර්ථික මතවාද පදනම් කරගත් අන්‍යොන්‍ය විවේචනය මුල් කොටගත් ප්‍රචාරණය, කඳවුරු තුළ දේශපාලන සම්බන්ධතා වර්ධනය කර ගැනීම, රහස් ඔත්තු සේවා මගින් සතුරු පක්ෂය පිළිබඳ තොරතුරු (විශේෂයෙන් යුද්ධෝපක්‍රම හා උපායන් පිළිබඳ තොරතුරු) එක්රැස්කිරීම, තම කඳවුරට අයත් රටවලට ආර්ථික හා යුදමය ආධාර ලබාදීම (ට්‍රෑමන් න්‍යාය, මාර්ෂල් සැලැස්ම, කොමින්ෆෝර්ම්) අමෙරිකාව හා රුසියාව අතර අවි තරඟය (පරමාණු, ජලකර, මිසයිල, ගුවන්යානා, චන්ද්‍රිකා තාක්ෂණය).

- 1948 බර්ලින් අර්බුදය හා 1950 කොරියන් යුද්ධය දෙපාර්ශවය අතර ශීතල යුද්ධයේ උච්ඡතම අවස්ථා දෙකක් වීම. මීට අමතරව සූවස් අර්බුදය, කොංගෝ අර්බුදය හා කියුබන් මිසයිල අර්බුදය ආදිය.

- 1949 දී NATO සංවිධානය බටහිර කඳවුරේ යුදමය සංවිධානය වශයෙන් බිහිවීම හා ඊට ප්‍රතිචාර ලෙස සෝවියට් කඳවුරෙන් වෝර්සෝ සංවිධානය බිහිවීම.

- CENTO හා SEATO ආදී වශයෙන් ආසියාකරයේද බටහිර කඳවුර හා සම්බන්ධ වූ ගිවිසුම් සංවිධාන බිහිවීම.
- එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ පවා මහා බලවතුන් දෙදෙනා සිය නිෂේධ බලය භාවිත කරමින් ශීතල යුද්ධයක නිරතවීම (තම දේශපාලන දර්ශනය අනුදත් ආණ්ඩු සහිත රටවලට සාමාජිකත්වය ලබාදීමට මෙන්ම ප්‍රතිවාදී කඳවුරට අයත් හෝ පක්ෂ රටවලට සාමාජිකත්වය ලබා නොදීමට උත්සාහ කිරීම නිදර්ශනයකි).

- 1985 මිහායිල් ගොර්බචොෆ් සෝවියට් රුසියාවේ ජනාධිපති බවට පත්වීමෙන් අනතුරුව කඳවුරු දෙක අතර මතභේද සමනය වන්නට පටන්ගැනීම හා ක්‍රමයෙන් තුෂ්ණී යුද තත්ත්වය තුනී වී යාම.

**(ලකුණු 08 යි)**

**(vi) එක්සත් ජාතීන්ගේ සංවිධානය**

- පසුබිම - 1945 අප්‍රේල් සිට ජූනි තෙක් පවත්වන ලද සැන්ෆ්‍රැන්සිස්කෝ සමුළුව (රටවල් 51ක නියෝජනය) මගින් එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තිය සකස්කිරීම.

- ඒ මත පිහිටා 1945 ඔක්තෝබර් 24 දින එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම (සැමරුම් දිනය).

- ව්‍යුහයඃ ප්‍රධාන ආයතන 6 කි

1) මහ සභාව 2) ආරක්ෂක මණ්ඩලය 3) ආර්ථික හා සමාජ මණ්ඩලය

4) භාරකාරත්ව මණ්ඩලය 5) මහ ලේකම් කාර්යාලය 6) ජාත්‍යන්තර අධිකරණය

- අරමුණු
    - ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යාම.
    - ජාතීන් අතර මිත්‍රත්වය වර්ධනය කිරීම.
    - ආර්ථික-සමාජ-සංස්කෘතික සහ මානුෂික ප්‍රවේශයකින් ප්‍රශ්න විසඳීම.
    - මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් තහවුරු කිරීමෙහිලා ජාත්‍යන්තර සහයෝගය ලබාගැනීම.
    - මෙම පොදු අරමුණු සපුරාගැනීම සඳහා ලෝක කේන්ද්‍රයක් ලෙස කටයුතු කිරීම.

♦ එක්සත් ජාතීන්ගේ සංවිධානය මිශ්‍ර සාර්ථකත්වයක් අත්පත් කරගෙන ඇතැයි කිව හැකිය. විශේෂයෙන් සාමය ආරක්ෂා කරගැනීම සම්බන්ධයෙන් එය ඇතැම් අවස්ථාවලදී සාර්ථකත්වයක් අත්පත්කරගෙන ඇත. කොංගෝවේ සිවිල් යුද්ධය, බටහිර නිව්ගිනියාව සම්බන්ධයෙන් ඕලන්දය හා ඉන්දුනීසියාව අතර ඇති වූ මතභේදය වැනි මහා බලවතුන් ඍජුවම සම්බන්ධ නොවූ අර්බුද සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සාම ප්‍රයත්න සාර්ථක වූ නමුත් මහා බලවතුන්ගේ අභිමතාර්ථ සමග ගැටුන අවස්ථාවල එම සාම ප්‍රයත්න සාර්ථක නොවීය.

♦ එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වූ කැපීපෙනෙන ලෝක අර්බුද කීපයක් පහත දැක්වේ:

- 1946 ඕලන්ද පාලනයෙන් නැගෙනහිර ඉන්දියා දූපත්වලට නිදහස ලබාගැනීමට ආධාර කිරීම.
- පලස්තීනය තුළ යුදෙව්වන් හා අරාබීන් අතර ඇති වූ ගැටුම (පූර්ණ සාමයක් ඇතිකිරීමට අසමත්වීම).
- 1950-53 කොරියන් අර්බුදය.
- 1956 සූවස් අර්බුදය.
- 1956 හංගේරියානු ජනතා නැගී සිටීම.
- බෙල්ජියම්-කොංගෝ සිවිල් යුද්ධය.
- සයිප්‍රස් ප්‍රශ්නය
- කාශ්මීර ප්‍රශ්නය
- 1968 චෙකොස්ලෝවෙකියානු අර්බුදය
- 1979 රුසියාව විසින් ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කිරීම

**(ලකුණු 08 යි)**

▲▲▲▲▲▲